
# සිරිලක කිරි බුරුල්ල බඳු

ශ්‍රී ලංකාව කිරියෙන් ඉතිරි වීමට නම් උඩ රට, පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශ හා උතුරු මැද පළාත අයත් වන නමන්කඩුව ප්‍රදේශයේ කිරි පට්ටි සංවර්ධනයට මුල් තැනක් දිය යුතුව ඇත. මෙම ප්‍රදේශ තුනෙන් නමන්කඩුව වඩා වැදගත් ප්‍රදේශය ලෙස සැලකෙන්නේ හේතු නැතුව නොවෙයි. සිංහල රජ දරුවන් දවස නමන්කඩුව රටේ "කිරි බුරුල්ල" ලෙස සැලකිණ. අදත් අපේ ගව සම්පතින් තුනෙන් දෙකක් පමණ ඇත්තේ නමන්කඩුවේ.


එහෙත් නමන්කඩුවේ කිරි නිෂ්පාදනය කාලයත් සමඟම දුර්වල තත් වයකට පත් වුණා. නිදහස ලැබීමෙන් පසුවත් මේ තත්වයේ වෙනසක් වුනේ නැහැ. නමන්ගේ කිරි හරක් ගෙන් ගෙදර දොර පාවිච්චියට කිරි දෙවා ගන්නවා මිසක් එය වාණිජමය කටයුත්තක් ලෙසින් කිරීමට නමන්කඩු ජනතාව උනන්දු වූයේ නැහැ. කිරි වලට සාධාරණ මිලක් නොමැති කමත් නමන්ට වැඩි කිරි විකිණීමට තැනක් නොමැති වීමත් මීට මූලික හේතු වුනා. මේ තත්වය වෙනස් කිරීමේ අරමුණ ඇතිවයි ජාතික කිරි මණ්ඩලය නමන්කඩුවේ උකු කිරි කම්හල පිහිටෙව්වේ.

පිටි කිරි නිෂ්පාදනයේ අතීතය දෙලොස් වන සියවස දක්වා දිවගියත් උකු කිරිවල ඉතිහාසය ශත වර්ෂයකට එහා යන්නේ නැහැ. ලොව මුල්ම උකු කිරි කම්හල ඇමරිකානු ජාතික ගේල් බොර්ඩන් පිහිටෙව්වේ 1856 දී මිනිසුන් අතරට ආ මුල්ම උකු කිරි වෙළඳ නාමය වුනේ "රාජාලියා". මුල් කම්හලට වැඩි ආයුෂක් තිබුනේ නැහැ. සථිර පදනමක උකු කිරි කම්හලක් 1860 ගණන්වල දී ඇමරිකාවේ ඉදිවුනා. දැන් ලොව හැමරටකම වාගේ උකු කිරි කම්හල් තියෙනවා.



පොළොන්නරුව ගොවිපලේ කිරි දෙවද්

"රාජලියා" සිට අපේ "පැරකුම්" යුගය දක්වා ගෙවුනේ සියවසක් පමණ යි. 'පැරකුම්" උකු කිරි දෙන නමන්කඩුවේ උකු කිරි කම්හලේ වැඩ 1965 දී ඇරඹුණා. අපෙන් රුපියල් දශ ලක්ෂ 6.5 ක් වැය වුනා. නවසීලන්තයෙන් දශ ලක්ෂ එක හමාරක් පමණ වටිනා යන්ත්‍රෝප-කරණ ආධාර වශයෙන් ලැබුණා. මුල්ම නිෂ්පාදන කටයුතු 1968 දී පටන් ගත්තා. මේ වනවිට වසරකට අවුන්ස 14 උකු කිරි ටින් දශ ලක්ෂ 25 ක් පමණ මෙරටට ගෙන් වූවා. රුපියල් දශ ලක්ෂ 19 ක පමණ විදේශ විනිමයක් වැය වුනා.



පොළොන්නරුව-ඉන්දිය දෙනුන්

## රජයේ සත්ව


උඩරට, පොල් ත්‍රිකෝණය හා නමන්කඩුව ප්‍රදේශවල කිරි පට්ටි සංවර්ධන කටයුතු මනා විද්‍යාත්මක තොරතුරු අනුව අද සංවිධානය කෙරුණත් ඊට අඩිතාලම වැටුනේ 1936 දී. විශේෂයෙන් ම දේශීය ගව සම්පත වැඩි වශයෙන්ම වෙසෙන නමන්කඩුව ප්‍රදේශයේ ගව සම්පත වැඩිදියුණු කිරීමේ අරමුණින් පොළොන් නරුවේ රජයේ සත්ව ගොවිපල 1938 දී පමණ පිහිටුවන ලදී. වසංගත රෝග මෙන් ම අනෙකුත් සෙසු ස්වාභාවික තර්ජන වලට මුහුණ දෙමින් සිටි දේශීය ගවයින් ගැලපෙන විදෙස් සතුන් සමඟ දෙමුහුන් කොට වඩා හොඳ සතුන් බෝ කිරීම මෙම ගොවිපලේ මූලික අරමුණ වඇත.

සින්දි නම් ඉන්දියානු හරකුන් හා ජර්සි දෙනුන් මේ සඳහා යොදා ගන්නා ලදී. මේ මඟින් බෝ කළ සතුන් හැරුනු විට නොමුහුන්

# තමන්කඩුව

උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත් වලින් දිනකට කිරි පයින්ට් 1,20,000 ක් ලබා ගෙන ඉන් උකු කිරි නිපදවීමේ හැකියාවක් පැරකුම් කම්හලට තිබෙනවා. ඒත් තවමත් දිනකට කම්හලට එකතු වන වැඩිම කිරි ප්‍රමාණය පයින්ට් 30 000 ක් පමණ වේ. දිනක දී අවුන්ස 14 උකුකිරි ටින් 48,000 ක් නිපදවීමට කම්හල සමත්. පෙබරවාරි මස උකු කිරි නිෂ්පාදනය දිනකට ටින් 35,000ක් පමණ වුණා.

කම්හල ආරම්භයේ තිබුනේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පහයි. දැන් එය 17 ක් දක්වා ඉහළ ගොහින්.



නිකවැරටිය–ශාන්තාගර්ට්රූඩීස්

## ගොවිපලවල්

සතුන් බෝ කිරීම පිණිස තර්පකාර් නම් ඉන්දීය ගව වර්ගයද ගොවිපල මගින් හඳුන්වා දී ඇත.

කිරි වැඩි ප්‍රමාණයක් ලබා දීමට නම් දරා නැති මූරා නම් ඉන්දීය මී හරක් ඒකකයක්ද පසුව ගොවි පලට එක් විය. බෝ කිරීම සඳහා අත්තිකාරම් සතුන් තබා ගැනීම මෙන්ම පට්ටි ගොනුන් සඳහා සුදුසු මී වසු පැටවුන් ජනතාවට සැපයීම මේ ඒකකයේ අරමුණය.

තමන්කඩුව කිරි කම්හල ඇරඹීමෙන් පසුව ඒ සඳහා දිනපතා කිරි සැපයීම ද ගොවිපලේ තවත් පරමාර්ථයක් වේ. මේ හැර වියලි කලාපය සඳහා සුදුසු තණ වර්ගවල රිකිලි මහජනයාට විකිණීමෙන් ප්‍රදේශයේ තණ වගාව දියුණු කිරීම ට ද ගොවිපල කටයුතු කරයි.

පොළොන්නරු ව මඩකලපුව පාරේ, කඳුරුවෙල පිහිටුවා ඇති සත්ව ගොවිපලේ බිම්



වසුපැටවුන්ට කිරි පොවන
ගොවිපල සේවකයෙක්

ප්‍රමාණය අක්කර 5,580 කි. මින් අක්කර 500 ක් විල්ලු තණ බිම් වේ. ගොවිපල තුළ ප්‍රධාන වැවක් හා කුඩා වැව් දෙකක් ඇත. මහවැලි ගඟ හා අඹන් ගඟ ගොවිපලට සමීපයෙන් ගලා යයි.

## නිකවැරටිය රජයේ සත්ව ගොවිපල

දඹුරුඹය අසල පිහිටුවා ඇති නිකවැරටිය රජයේ සත්ව ගොවිපලත්, 1936 පිහිටුවන ලද්දකි ගොවිතැන් කටයුතු වලට හා කරත්ත වලට බැඳීමට යොද ගත හැකි වඩා හොඳ ගොනුන් මහජනතාවට ලබා දීම නිකවැරටිය සත්ව ගොවිපලේ මූලික පරමාර්ථය යි. බර ඇදීමට නම් දරා ඇති කඩිසර ඉන්දීය ගව වර්ගයක් වන කිලාරි වර්ගයේ ගවයින් මෙරටට බෙද හරිනු යේ නිකවැරටිය ගොවිපලිනි. කිලාරි සතුන් කිරි සැපයීම අතින් දුර්වලය. කිලාරි සතුන් උතුරු හා නැගෙනහිර පළාත්වල ඉතා ජනප්‍රිය ය.

හරියානා නිකවැරටිය ගොවිපලෙන් මෙරටට හඳුන්වා දෙන තවත් ඉන්දීය ගව සම්පතකි. හරියානා දෙනුන් කිරට නම් දරන අතර, එම ගොනුන් ඕනෑම බරක් ඇදීමට සමතුන් ලෙස සැලකේ. කිලාරි සතුන් මෙන් කඩිසර නොවූවද, හෙමින් වැඩි බරක් ඇදීමට සමත් මෙම ගොනුන් පොල් ත්‍රිකෝණයේ ජනතාව අතර ජනප්‍රිය ය.

මස් පිණිස ම වෙන් වූ ගව වර්ගයක් මෙරටට හඳුන්වා දීම සඳහා පර්යේෂණ කටයුතු කිරීම නිකවැරටිය ගොවිපලේ අළුත් ම ක්‍රියා දමය වී ඇත. ශාන්තා නම් ඉන්දීය ගව වර්ගයක් හා ගර්ට්රූඩීස් නම් ඕස්ට්‍රේලියානු ගව වර්ගයක් දෙමුහුන් කිරීමෙන් ලබා ගත් ශාන්ත ගර්ට්රූඩීස් ගොනුන් සිංහල දෙනුන් හා දෙමුහුන් කිරීමෙන් මසට සුදුසු දේශීය ගව වර්ගයක් බිහි කිරීම මෙම ඒකකයේ අරමුණය.